2019 අප්‍රේල් මස 21 වන දින දිවයිනේ ස්ථාන කිහිපයක සිදු වූ පිපිරීම් ආශ්‍රිත සිදුවීම් මාලාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා වන විශේෂ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාවෙහි විධායක සාරාංශය සහ එහි අඩංගු නිර්දේශයන්

2019 ජූනි

පටුන

පිටු අංකය

විධායක සාරාංශය 01

විශේෂ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් 15

විධායක සාරාංශය

පාස්කු ඉරිදා උදෑසන සිදු වූ පිපිරීම් හය සහ එදිනම දහවල් සිදුවූ තවත් පිපිරීම් දෙකක් පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන ආරම්භ කරන ලදි. මෙම පිපිරීම් අටම, මරාගෙන මැරෙන බෝම්බ කරුවන් විසින් සිදුකරන ලද බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දීමේදී තහවුරු කරන ලදි. පරීක්ෂණ වලදී තව දුරටත් අනාවරණය වූයේ සිව් වන පිපිරුමක් සඳහා උත්සාහයක් ටාජ් සමුද්‍රා හෝටලයේදී සිදුවූ නමුත් තාක්ෂණික හේතුවක් නිසා එම උත්සාහය අසාර්ථක වූ බවයි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ මූලික පරීක්ෂණවලදී 2019 අප්‍රේල් 21 දින සිදු කරන ලද පිපිරීම්වලට ජාතික තව්හීද් ජමාත් (NTJ) සංවිධානය සහ එහි නායකයා වන මොහොමඩ් හෂීම් මොහොමඩ් සහරාන් සම්බන්ධ බව තවදුරටත් තහවුරු කර ගන්නා ලදී.

පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ හෙළිදරව් වූ ආකාරයට, ශ්‍රී ලංකාව තුල අයි එස් කණ්ඩායම් හා සම්බන්ධිත සිද්ධීන්ගේ වැඩිවීම් පිළිබඳව, රාජ්‍ය බුද්ධි සේවය විසින් ආරක්ෂක ලේකම්, ජාතික බුද්ධි ප්‍රධානී සහ පොලිස්පතිහට 2015 වර්ෂයේ සිට බුද්ධි තොරතුරු ඉදිරිපත් කර ඇත. මෙම කරුණු සතිපතා බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම්වලදී සහ අවස්ථා කීපයකදී ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡා කර ඇති නමුත් කිසිදු සැලසුම් සහගත ක්‍රියා මාර්ගයක් පිළිබඳව ස්ථාවර තීරණයක් ගෙන නොමැත.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ විසින් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දෙනු ලැබූ අවස්ථාවේදී, 2016 අයවැය විවාදයේදී ඔහු විසින් කරන ලද කතාවෙහි, ශ්‍රී ලංකාව තුල ඉස්ලාමීය අන්තවාදය සහ අයි එස් කණ්ඩායම සමඟ ඇති සබඳතා ගැන කල හෙළිදරව් පිළිබඳව සඳහන් කරන ලදි. මෙමඟින් පැහැදිලි වන්නේ 2014-2017 කාල සීමාව තුළදී ඉස්ලාම් අන්තවාදයේ පැතිරීම තර්ජනාත්මක අයුරින් පැවති බව මහජනතාව අතර ප්‍රසිද්ධ රහසක් වුවද මෙම තත්වයන් වැලැක්වීම සඳහා ක්‍රියා මාර්ග ගතයුතු වගකිව යුත්තන් ජාතීන් අතර වාර්ගික හා ආගමික සංහිඳියාවට මැදිහත් වීමට ඇති අකමැත්ත මත මෙම කාරණාව සම්බන්ධයෙන් නොදන්නා අයුරින් ක්‍රියාකර ඇති බවයි.

කෙසේ වෙතත් පරීක්ෂණ මණ්ඩලය විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණ නම් සාම්ප්‍රදායික ඉස්ලාම් අදහස් සහ අන්තවාදය අතර පවතින වෙනස තේරුම් ගැනීමට වගකිව යුත්තන් විසින් අසමත් වීමයි. කෙසේ වුවද පොලිස් නිලධාරියෙකු හෝ ජාතික ආරක්ෂාව සඳහා වගකිව යුතු කිසිදු පුද්ගලයෙකු හට වාර්ගික හා ආගමික සංහිඳියාව පිළිබඳව පමණක් සලකා, ජාතික ආරක්ෂාව අවධානමට ලක් වන අවස්ථාවන්හිදී එය මඟහැර සිටීමට කිසිදු යුතුකමක් නැත.

2018 දෙසැම්බර් සිට ජාතික තව්හීද් ජමාත් නායකත්වය සහ සාමාජිකයින් ක්‍රියාකාරී වී ඇත. 2018 දෙසැම්බර් 23 සිට 26 කාලය තුල, හඳුනා නොගත් පිරිස් විසින් මාවනැල්ල සහ ගම්පොළ යන ප්‍රදේශවල ආගමික පිළිම වලට පහර දෙන ලදි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම පහර දීම් පිළිබඳව

පරීක්ෂණ සිදු කරන අතරදී මෙම සිදුවීම් වලට ජාතික තව්හීද් ජමාත් කණ්ඩායම සම්බන්ධ බව සහ වනාතවිල්ලුව ප්‍රදේශයේ පැවති පුහුණු කඳවුරක් පිලිබඳ තොරතුරු අනාවරණය කර ගන්නා ලදි. වනාතවිල්ලුව පුහුණු කඳවුර අනාවරණය කර ගැනීම තුලින් විශාල පුපුරණ ද්‍රව්‍ය තොගයක් සොයා ගැනීමට හැකියාව ලැබී ඇත.

අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවය, පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දෙමින්, 2019 අප්‍රේල් 09 දින ජාතික බුද්ධි ප්‍රධානී විසින් පොලිස්පති වෙත නිකුත් කරන ලද බුද්ධි අවදානමක් පිළිබඳව සඳහනක් සිදු කරමින්, 2019 අප්‍රේල් 04 දින ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායමක් විසින් සිදුකල හැකි ප්‍රහාරාත්මක සැලැස්මක් පිළිබඳව වාචික තොරතුරක් ලැබුණු බව සහ ඊට පසුදින විදේශිය ප්‍රතිපාර්ශවයක් විසින් එම වාචික තොරතුර ලිඛිතව තහවුරු කරන ලද බවත් සඳහන් කරන ලදි. ඔහුගේ 2019 අප්‍රෙල් 07 දිනැති ලිපිය මගින් මෙම තොරතුරු ජාතික බුද්ධි ප්‍රධානී වෙත, දැනගැනීම සහ උපදෙස් සඳහා ඉදිරිපත් කර ඇති අතර, ආරක්ෂක ලේකම් හටද වාචිකව දන්වා ඇත. 2019 අප්‍රෙල් 9 දින වන විට ලැබුණු බුද්ධි තොරතුරු ඔහු විසින් විශ්ලේෂනය කොට, එම තොරතුරු ඔහු විසින් දැනටමත් පවත්වමින් සිටින මාවනැල්ල ප්‍රහාරය සහ වනාතවිල්ලුව කඳවුර පිලිබඳව වන විමර්ශන සඳහා වැදගත් වන හෙයින්, ඉහතකී ප්‍රහාරයට සම්බන්ධවන පුද්ගලයන් පිළිබඳව තොරතුරු ඇතුලත් සම්පූර්ණ වාර්තාවක් සකසා පොලිස්පති වෙත සහ එහි පිටපතක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ අනාවරණය කරන ලද පරිදි, මෙම අවස්ථාවේදී බුද්ධි තොරතුරු ඉදිරිපත් කිරීමේදී නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොමැති නමුත් 2019 අප්‍රේල් 09, බුද්ධි අංශ ඇඟවීමක් මගින් ආරක්ෂක ලේකම් වෙනුවෙන් ජාතික බුද්ධි ප්‍රධානී විසින් අත්සන් තබන ලද ලිපියකින් "මෙම තොරතුරු පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන අවධානයෙන් සිටීම පිළිබඳව දැනුවත් කිරීමේ වැදගත්කම" පිළිබඳව පොලිස්පති වෙත ලබා දී ඇති අතර මෙම කාරණය පිළිබඳව තවත් බුද්ධි තොරතුරු විශ්ලේෂනයක් අධ්‍යක්ෂ රාජ්‍ය බුද්ධි සේවය විසින් පොලිස්පති වෙත ලබාදී ඇත.

2019 අප්‍රේල් මස 9 වන දින පොලිස්පති තුමා වෙත මෙම බුද්ධි තොරතුරු ලැබුණු පසු "සුදුසු කටයුතු සඳහා" යන සටහනක් යොදා එම තොරතුරු බෙදා හැරීමට තීරණය කර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිව් දෙනෙක් වන පහත නිලධාරීන් සමඟ පමණි.

1. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර
2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ හා විශේෂ කාර්ය බලකාය
3. නියෝජ්‍ය පොලිස්පති විශේෂ ආරක්ෂක කොට්ඨාශය
4. අධ්‍යක්ෂ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය

පරීක්ෂණ මණ්ඩලය විසින් තව දුරටත් නිරීක්ෂණය කිරීමේදී, පොලිස්පති වරයා විසින් මෙම බුද්ධි අංශ තොරතුරු තෝරාගත් නිලධාරීන් සිව්දෙනෙකු හට පමණක් සීමා කිරීම මගින් මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින නැගෙනහිර පළාත ඇතුළු පළාත් අටක ආරක්ෂාව සඳහා වගකිව යුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් අට දෙනෙකු ඇතුළු අනිකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද, එන්.ටී.ජේ සංවිධාන කටයුතු සහ එහි නායක සහරාන් හෂීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා පත් කර ඇති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්‍ෂණ කටයුතු මෙහෙයවමින් සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ ප්‍රභූ ආරක්ෂාව භාරව කටයුතු කරන ජනාධිපති ආරක්‍ෂක අංශයේ සහ අගමැති ආරක්‍ෂක අංශයේ ප්‍රධානීන් ද අගතියකට පත් කරනු ලැබ ඇත.

2019 අප්‍රේල් 17 දින මොහමඩ් මුස්තාපා හසනුන් ෆස්රි නමැත්තෙකු විසින් කාත්තන්කුඩි පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති අතර ඔහුට අයත් ඉඩමක් තුළ 16 වන රාත්‍රියේ යතුරු පැදියක් ගිනි ගැනීමෙන් පිපිරීමක් සිදුවී ඇති බවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ. මෙම තොරතුරු මත ඒ පිළිබඳ පරීක්‍ෂණයට කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මෙම වෙරළ තීරයට යාබද අක්කර 43 ක හිස් භූමිය පරීක්ෂා කර ඇත.

එදිනම මෙම තොරතුරු පිළිබඳව දැනගත් රාජ්‍ය බුද්ධි සේවය සහ එම නිලධාරීන්ද මෙම ස්ථානය පරීක්ෂා කර ඇත.

පිපිරුම සිදුවූ ස්ථානයට ගිය නිලධාරින්හට යකඩ අංශු විශාල ප්‍රමාණයක් යොදා නිපදවා ඇති යතුරු පැදි බෝම්බය පුපුරා ගොස් ඇති බවත්, මෙම පිපිරීම සිදුවන්නට ඇත්තේ කණ්ඩායමක් විසින් අත්හදා බැලීම් සිදු කරන විට බවත් මෙවැනි බෝම්බ මගින් තවදුරටත් දරුණු හානි සිදු කිරීමේ අදහසින් බවටත් සැක පහලවී ඇත.

2019 අප්‍රේල් 18 වන දින අධ්‍යක්ෂ බුද්ධි අංශ සේවය විසින් මෙම පිපිරීම හා ඊට අදාල සියළුම තොරතුරු සහ ඉන් අනතුරුව බුද්ධි අංශ විසින් පහත සිද්ධීන්ට අදාලව සොයගත් සියළු තොරතුරු පොලිස්පතිවරය වෙත ලබා දී ඇත.

(අ) 2018 දෙසැම්බරයේ මාවනැල්ල දී සිදු වූ සිද්ධිය සහ

(ආ) වනාතවිල්ලුවේදී සොයාගත් පුපුරණ ද්‍රව්‍ය පිළිබඳව

පොලිස්පතිවරයාට ලබාදුන් ඉහත බුද්ධි තොරතුරු වලට අමතරව, අධ්‍යක්ෂ බුද්ධි අංශ සේවය විසින් තවත් වාර්තා දෙකක්, අප්‍රේල් 19 සහ 20 වන දිනවල පොලිස්පතිවරයා වෙත ලබා දී ඇත.

ආරක්ෂක ලේකම් වෙනුවට ජාතික බුද්ධි ප්‍රධානී විසින් පොලිස්පති වෙත යවන ලද බුද්ධි තොරතුරු පොලිස්පතිතුමා විසින් කිසිදු අවධාරණයකින් තොරව "සුදුසු කටයුතු සඳහා" යන අනු සටහන යොදා පමණක් අනෙකුත් නිලධාරීන්හට එම තොරතුරු දැනුම් දුන්නද, අනෙකුත් පහල නිලධාරීන්හට මෙවැනි කතෝලික පල්ලි ඉලක්ක කොට ගත් මරාගෙන මැරෙන පිපිරීමක් පිළිබඳව දැක්වෙන බුද්ධි තොරතුරක් බව සැලකිල්ලට නොගෙන එය කුණු කූඩයට හෝ නැවත එවැනිම සටහනක් යොදා පහල නිලධාරියෙකු වෙත යොමු කිරීමට අයිතියක් නොමැත.

ඉහත සඳහන් කළ නිලධාරීන් හතර දෙනා පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා ඔවුන් ඒ සඳහා ගත් කඩිනම් ක්‍රියාමාර්ග පිළිබඳව සාක්ෂිද සමඟ කැඳවූ අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එන්. පී. නන්දන මුණසිංහ මහතා එම බුද්ධි අංශ තොරතුරු ලත් නිලධාරී හතරෙන් කැඳවූ පළමු පුද්ගලයා විය. ඒ අනුව ඔහු විසින් අත්සන් කරන ලද උපදෙස් ලිපියක් සහිතව ඔහු යටතේ ක්‍රියා කල නියෝජ්‍ය පොලිස්පතිවරුන් හතර දෙනා වෙත බුද්ධි තොරතුරු බෙදාදුන් බව ප්‍රකාශ කළේය.

අදාළ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත යොමු කරන ලද ලිපියේදී ඔහු වැදගත් උපදෙස් කිහිපයක් ලබා දී ඇති අතර, එම උපදෙස් අදාළ පොලිස් ස්ථානයන් විසින් පිළිපදිනු ලැබුවේ නම්, 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ සිදුවීම් අවම කර ගැනීමට ඉඩ තිබූ බව පරීක්ෂණ මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී.

2019 අප්‍රේල් 20 වැනි දින සවස් යාමයේ බුද්ධි අංශ වෙතින් ලැබුණු තොරතුරුවලට අනුව හෝටල් වලට සිදු කිරීමට සැලසුම් කල ප්‍රහාර සම්බන්ධව කිසිදු තොරතුරක් ලැබුණු බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එන්. පී. නන්දන මුණසිංහ මහතා ප්‍රතික්ෂේප කරන ලදි. එබැවින් එදින සවස බස්නාහිර පළාතේ හෝටල් වලට ආරක්ෂාව සැපයීම සඳහා කිසිදු පොලිස් නිලධාරියෙකුට නිශ්චිත උපදෙස් ලබා නොදුන් බව සඳහන් කරන ලදි.

කෙසේ වුවද මෙම තත්ත්ව රාජ්‍ය බුද්ධි සේවයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, මෙම මණ්ඩලය ඉදිරියේ පෙන්වා දුන් තත්වයට පරස්පර විරෝධී වේ. ඒ අනුව බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඔහුට 2019 අප්‍රේල් 20 වන දින සවස ලැබුණු බුද්ධි තොරතුරු මත වහාම අදාළ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට දැනුම් දුන්නද, පල්ලිවලට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දුන්නාද යන්න පෞද්ගලිකව පරීක්ෂා නොකළ බවත් සඳහන් කරන ලදි.

ජාතික බුද්ධි ප්‍රධානී විසින් 2019 අප්‍රේල් 09 වන දින නිකුත් කල බුද්ධි තොරතුරු කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් පල්ලියේ පිපිරීමට පෙරාතුව නියමිත පරිදි තමන් වෙත ලැබුනාද යන්න දැන ගැනීම සඳහා පරීක්ෂණ මණ්ඩලය නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර උතුර පළාත, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මීගමුව, සහකාර පොලිස් අධිකාරී මීගමුව III සහ පොලිස් ස්ථානාධිපති කටාන කැඳවන ලදි.

පරීක්ෂණ මණ්ඩලයට මේ පිළිබඳව අනාවරණය වූයේ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට කාලයක් ගත වී තිබුණද පොලිස් ස්ථානාධිපති කටාන වෙත එම තොරතුරු 2019 අප්‍රේල් 13 දින ලැබී ඇති අතර එම බුද්ධි තොරතුර ගැන 2019 අප්‍රේල් 20 දින දක්වා කිසිදු පියවරක් ගෙන නොමැති බවයි. සහකාර පොලිස් අධිකාරී මීගමුව III සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මීගමුව යන අයද ඔවුන් හට නියමිත අධීක්ෂණය කිරීමට අසමත් වී ඇත.

එලෙසින්ම, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදුවූ පිපිරීම සම්බන්ධයෙන්, පරීක්ෂණ මණ්ඩලය විසින් 2019 අප්‍රේල් 21 වන දිනට පෙර බුද්ධි තොරතුර නිසි ලෙස ව්‍යාප්ත කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිශාව, පොලිස් අධිකාරී කොළඹ උතුර සහ සහකාර පොලිස් අධිකාරී කොළඹ දිස්ත්‍රික් III සහ පොලිස් ස්ථානාධිපති වෙරළබඩ කැඳවන ලදි. මෙහිදී පරීක්ෂණ මණ්ඩලය වෙත අනාවරණය වූයේ මෙම බුද්ධි තොරතුර කොළඹ උතුරු පොලිස් අධිකාරීවරයාගෙන් ඔබ්බට, සහකාර පොලිස් අධිකාරී හා පොලිස් ස්ථානාධිපති වෙත යවා නොමැති බවත්, කොච්චිකඩේ සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් අධිකාරීවරයා එම අඩුපාඩු සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම වගකිව යුතු බවත්ය. පරීක්ෂණ මණ්ඩලය තව දුරටත් නිරීක්ෂණය කරනු ලැබුවේ, වෙරළබඩ පොලිස් ස්ථානයේ කොළඹ උතුරු පොලිස් අධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ ඇති ඒකක වල නඩත්තු කරනු ලබන ලේඛන වල අසත්‍ය සටහන්ද යොදා ඇති බවය.

බුද්ධි තොරතුර බෙදා හැරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ සහ විශේෂ කාර්ය බලකාය, නියෝජ්‍ය පොලිස්පති විශේෂ ආරක්ෂක කොට්ඨාශය, අධ්‍යක්ෂ ප්‍රතිත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය ක්‍රියා කොට ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂණය වන්නේ මෙම තොරතුරු ප්‍රමාණවත් කාලය ලබාදෙමින් බෙදා හැර තිබුනද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් තම කණිෂ්ඨ නිලධාරීන් අධීක්ෂණ සම්බන්ධයෙන් බරපතල අඩුපාඩු ඇති බවය.

2019 අප්‍රේල් 20 වන දින ලැබුණු විශේෂ බුද්ධි තොරතුර සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පති, ආරක්ෂක ලේකම්, බුද්ධි ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත යන සියළු නිලධාරීන් බරපතල ලෙස අසමත්ව ඇති බව පරීක්ෂණ මණ්ඩලය විසින් නිරීක්ෂණය කර තිබේ.

පරීක්ෂණ මණ්ඩලයේ කැඳවීම පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පිපිරීම් අට හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාවේ වෙනස පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන ලදි.

පරීක්ෂණ මණ්ඩලයට පිළිතුරු දෙමින් ඔහු සඳහන් කළේ 2019 මැයි 05 දින වන විට මුළු මරණ සංඛ්‍යාව 259 ක් ලෙසිනි. ප්‍රතිකාර ලබමින් සිටියදී රෝහල්වල තුවාල ලැබූ සමහර අයගේ මරණද මෙයට ඇතුළත් වේ. සාක්ෂිකරුට අනුව එදිනට වාර්තා වූ මුළු තුවාල කරුවන් සංඛ්‍යාව 497 කි.

වෛද්‍ය ජයසිංහ විසින් ලබාදුන් ඉහත මරණ සංඛ්‍යාවත් සමඟ සාමාන්‍ය ජනතාව තුල මරණ සංඛ්‍යාව සම්බන්ධයෙන් වූ ව්‍යාකූල බව ඉවත් කළ හැක. ඒ සම්බන්ධයෙන් පොලිස් මාධ්‍ය ප්‍රකාශක එස්. එම්. රුවන් ගුණසේකර මහතා කැඳවා ප්‍රකාශයට පත් කරන ලද මරණ සංඛ්‍යාව නිවැරදිව පැහැදිලි කිරීමට පරීක්ෂණ මණ්ඩලය විසින් පියවර ගන්නා ලදි.

ගුණසේකර මහතාට අනුව පොලිස් මූලස්ථානයේ විශේෂ මෙහෙයුම් ඒකකය පිහිටුවීමෙන් පසු පොලිස් මාධ්‍ය ඒකකය එම ඒකකය හා නිරතුරුව සම්බන්ධ වූ අතර නිවේදන මගින් ප්‍රකාශයට පත් කරන ලද මරණ සංඛ්‍යාව එකී විශේෂ මෙහෙයුම් ඒකකය වෙතින් ලබාගෙන ඇත. 2019 අප්‍රේල් 24 වෙනි දින සවස ලැබුණ තොරතුරු අනුව මරණ සංඛ්‍යාව 359 දක්වා ඉහළ ගොස් තිබේ. ඊළඟ දිනයේදී මිය ගිය සංඛ්‍යාව තවදුරටත් වැඩි වුවද, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදුන් මරණ සංඛ්‍යාව සමඟ නොගැලපෙන තත්වයක් ඇති වූ බැවින් එය නිවේදනය නොකිරීමට තීරණය කර ඇත. එම අවස්ථාවේ සිට ඔහු විසින් මියගිය සංඛ්‍යාව ප්‍රකාශයට පත් නොකළද, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මරණ සංඛ්‍යාලේඛන නිරූපණය කරන්නේ නිවැරදි සංඛ්‍යා බව ප්‍රකාශ කරන ලදි.

කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ ප්‍රධාන පූජක, පූජ්‍ය කුරුකුලසූරිය ඇන්ටන් ජූඩ් ප්‍රනාන්දු, මීගමුව කටුගම්පිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ සහකාර පූජක පූජ්‍ය සමීර රොද්‍රිගෝ, මඩකලපුව සියොන් පල්ලියේ පූජක රොෂාන් මහේෂන් යන අය 2019 අප්‍රේල් 21 දින උදෑසන සිදුවූ ප්‍රහාරයන් පිළිබඳව පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දුන්හ. කිංස්බරි, ෂැංග්‍රි ලා, සිනමන් ග්‍රෑන්ඩ් සහ ටාජ් සමුද්‍රා යන හෝටල් හි ආරක්ෂක අධ්‍යක්ෂකවරු සිව්දෙනා ද පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දුන්හ. මේ සියලු සාක්ෂිකරුවන්ට අනුව, 2019 අප්‍රේල් 21 දිනට පෙර බලධාරීන් විසින් කිසියම් හෝ ආකාරයක ආරක්ෂක තර්ජනයක් පිළිබඳව දැනුම් දී නොමැත.

අනුකම්පා විරහිත ජාතික තව්හීද් ජමාත් (NTJ) සාමාජිකයක් විසින් දියත් කල පාස්කු ඉරිදා ප්‍රහාර වලින් පසුව මද්‍රසා පාසල්වල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමේ දුර්වලතා සම්බන්ධයෙන් මුද්‍රිත හා සමාජ මාධ්‍යවල සාකච්ඡාවට ලක් විය.

පරීක්ෂණ මණ්ඩලයවිසින් මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂක සාක්ෂි ලබා ගැනීම සඳහා කැඳවූ අතර, ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව මද්‍රසා පාසල්වල පාලනය මෙම දෙපාර්තමේන්තුව යටතට පත්වූයේ 1986 වර්ෂයේ සිට වන අතර ඊට පෙර මෙම පාසැල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පැවති බවය. පරීක්ෂණ මණ්ඩලය විසින් නිරීක්ෂණය කල පරිදි දෙපාර්තමේන්තුව විසින් විශේෂිත විෂය නිර්දේශයක් අනුමත කර නොමැති අතර මද්‍රසා පාසල් හට ඔවුන්ගේ විෂය නිර්දේශය තීරණය කිරීමට නිදහස ඇත. නමුත් මද්‍රසා පාසල් විසින් ප්‍රධානය කරනු ලබන සහතිකය, රජයේ ගුරු විභාගය සඳහා පෙනී සිටීමට අවශ්‍යවන මූලික සුදුසුකම් වලින් එකකි.

පරීක්ෂණ මණ්ඩලය විසින් පාස්කු ඉරිදා ප්‍රහාරය පිටුපස සිටින කණ්ඩායම හඳුනා ගැනීමේ උත්සාහයක් ද සිදු කරන ලදී. පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ සාක්ෂි වලින් මෙම ප්‍රහාරය සහරාන් හෂීම් විසින් මෙහෙයවනු ලැබූ කණ්ඩායම විසින් කල බවට තහවුරු වුවද, ප්‍රහාරය සඳහා වගකිව යුත්තේ ජාතික තව්හීද් ජමාත් (NTJ) බව නිගමනය කිරීමට සහ ජාතික තව්හීද් ජමාත් (NTJ) නායකයා සහරාන් හෂීම් බවට නිගමනය කිරීම සඳහා සෑහීමකට පත්විය හැකි සාක්ෂි නොමැත.

අයි එස් සංවිධානය විසින් මෙම ප්‍රහාරයේ වගකීම බාරගනු ලැබුවද, ඔවුන් ශ්‍රී ලංකාව මෘදු ඉලක්කයක් ලෙස සැලකීම හැර, ශ්‍රී ලංකාව ප්‍රහාරයක් සඳහා ඉලක්ක කර ගැනීමට පාදක වූ විශේෂිත හේතුවක් හඳුනා ගත නොහැක. එලෙසම මෙම ප්‍රහාරයන් සඳහා කතෝලික පල්ලි සහ හෝටල් ඉලක්ක කර ගැනීමට විශේෂිත වූ පිළිතුරක් සොයා ගැනීමට ද පරීක්ෂණ මණ්ඩලයට නොහැකි විය.

පරීක්ෂණ මණ්ඩලය විසින් අධිකාරීන්හි අතපසුවීම් පැහැදිලි වශයෙන් හඳුනාගෙන ඇති අතර මෙම අතපසුවීම් පහත දැක්වෙන මාතෘකා යටතේ හඳුනා ගෙන ඇත.

1. බුද්ධි අංශය
2. විමර්ශන
3. සන්නිවේදන
4. මෙහෙයුම් ක්‍රියා පටිපාටිය
5. පරිපාලන ක්‍රියා පටිපාටිය

ඒ අනුව පරීක්ෂණ මණ්ඩලය විසින් අදාල නිර්දේශයන් ඉදිරිපත් කරන ලදුව ඒ ඒ නිර්දේශයන්ට පදනම් වූ හේතුන්ද, පරීක්ෂණ මණ්ඩලයට පවරන ලද සීමාවන් තුල සිදු කර ඇත.

සාමාන්‍ය මහජනතාව මෙම පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව මත දැඩි බලාපොරොත්තු තබා සිටින බව මුද්‍රිත සහ සමාජ ජාලා වලින් පරීක්ෂණ මණ්ඩලයට දැන ගැනීමට ලැබුනද, මෙම පරීක්ෂණ මණ්ඩලයේ කාර්ය භාරය ඊට ලබා දී ඇති බලතල වලට අනුව සිදු කර ඇත. මෙම පරීක්ෂණ මණ්ඩලය, සත්‍ය සොයාගැනීමේ මෙහෙයුමක් පමණක් වන අතර විමර්ශන බලතල සහිත යාන්ත්‍රණයක් නොමැති බවද සඳහන් කල යුතුය.

මෙම තත්ත්වයන් තුළ මහජනයා අපේක්ෂා කරන පරිදි යම් යම් පුද්ගලයන්ගේ සබඳතා විමර්ශනය කිරීමට පරීක්ෂණ මණ්ඩලයට නොහැකි විය. මෙම කරුණු පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශයන් තුලද සඳහන් කර ඇත.

විශේෂ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන්

01. ජාතික බුද්ධි සේවාවක් ස්ථාපිත කිරීම:

මෙරට ජාතික ආරක්ෂාව සඳහා බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ කාර්යය භාරය පැවරී ඇති ප්‍රධාන ආයතන දෙකක් ඇත. එනම්, රාජ්‍ය බුද්ධි සේවාව සහ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයයි. (DMI) මෙයට අතිරේකව පොලිස්පති යටතේ ක්‍රියාත්මක වන පොලිස් විශේෂ කාර්යාංශය නමින් හඳුන්වන පොලිස් බුද්ධි අංශයද, ජාතික ආරක්ෂාවට අදාල තොරතුරුද එක්රැස් කරනු ලබයි. එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය විසින් ඔවුන්ගේ විමර්ශනයන්හිදී අනාවරණය වන ජාතික ආරක්ෂාවට අදාල කරුණු කෙරෙහිද, විශේෂ අවධානයකින් යුතුව ක්‍රියා කරනු ලබයි.

මෙම සියලු ආයතන අතරින් ජාතික ආරක්ෂාවට අදාල බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ කාර්යයභාරය පැවරී ඇති ප්‍රධානතම ආයතනය වනුයේ රාජ්‍ය බුද්ධි සේවාවය. යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය ඊ සඳහා ඇති ඊළඟ ආයතනයයි. රාජ්‍ය බුද්ධි සේවාවට අනුයුක්ත නිලධාරීන් අතරින්, වැඩි දෙනෙකු පොලිස් නිලධාරීන් වන අතර යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් නිලධාරීන් අතරින් වැඩි දෙනා යුධ හමුදා නිලධාරීන් වේ. මෙලෙස පොලිස් හා යුධ හමුදා නිලධාරීන් එකිනෙකට වෙනස් ආයතන දෙකකට බෙදී බුද්ධි තොරතුරු එක්රැස් කිරීම එතරම් සාර්ථක ක්‍රියාවලියක් නොවන බව පෙනී ගොස් ඇත. විශේෂයෙන් බුද්ධි තොරතුරු ලබාගැනීමේදී එකිනෙකා අභිබවා යාමේ ප්‍රවනතාවයක් මෙන්ම ඔවුන් සතු බුද්ධි තොරතුරු බෙදාගැනීමට දක්වන මැලිකමක් පිළිබඳවද නිරීක්ෂණය වේ. 2019.04.21 දින ප්‍රහාරය එල්ල කරනු ලැබූ, සහරාන් මවුලවී සහ ඔහුගේ ත්‍රස්තවාදී කණ්ඩායම පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවාව හා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව තිබූ තොරතුර එකිනෙකා අතර හුවමාරු කර ගැනීමේ අඩුපාඩු කිහිපයක්ම දක්නට ලැබුණි. මෙය ඉතා භයානක තත්ත්වයකි. 2019.04.21 දින එල්ල වූ ප්‍රහාරය එයට කදිම නිදසුනකි. මෙම පරීක්ෂණ කමිටුව ඉදිරියේ අනාවරණය වූ තවත් වැදගත් කරුණක් වූයේ 2019.04.21 දින එල්ල වූ ප්‍රහාරය පිළිබඳව පූර්ව බුද්ධි තොරතුරු ලැබී

තිබියදීත්, එම ප්‍රහාරය වලක්වා ගැනීමට අපොහොසත් වීමට ප්‍රධාන වශයෙන් බලපෑ එක් කරුණක් වූයේ ලැබී තිබූ බුද්ධි තොරතුරු අවශ්‍ය ආයතන සහ නිලධාරීන් වෙත සංනිවේදනය වී නොතිබීමය. අවම වශයෙන් රාජ්‍ය නායකයා වන අතිගරු ජනාධිපතිතුමාට හෝ ගරු අග්‍රාමාත්‍යතුමාට මෙම තොරතුර ප්‍රහාරයට ප්‍රථම සංනිවේදනය කර තිබූ බව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි කමිටුව වෙත ඉදිරිපත් නොවීය. එමගින් පෙනී යන ලද්දේ, රාජ්‍ය බුද්ධි සේවයට විදේශ රටකින් ලද බුද්ධි තොරතුර ආරක්ෂක අමාත්‍යාංශයට බැහැර කර ඇති නමුත්, ඉන් ඔබ්බට එය නිසි ලෙස බැහැර කර නොතිබීම මෙම ප්‍රහාරය වලක්වාගැනීමට තිබූ අවස්ථාවන් ගිලිහී යාමට එක් ප්‍රධාන හේතුවක් වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

එබැවින්, ජාතික ආරක්ෂාවට අදාල බුද්ධි තොරතුරු එක්රැස් කිරීම හා බෙදාහැරීමේ කාර්යය සඳහා එක් ජාතික බුද්ධි සේවාවක් පමණක් පවත්වාගෙන යාමත්, එය සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් ලෙස (සන්නද්ධ හමුදා හෝ පොලිසියෙන් බැහැර) පවත්වාගෙන යාමත් අත්‍යාවශ්‍ය වේ. උදාහරණ: CIA, RAW ලෙසට.

02. ජාතික බුද්ධි සේවාව ව්‍යවස්ථාපිත පනතකින් පිහිටුවීම:

දැනට ක්‍රියාත්මක ප්‍රධාන බුද්ධි ආයතන කිසිවක් ව්‍යවස්ථාපිත නීතිමය රාමුවකින් ආවරණය වූ ආයතන නොවේ. ඒවා ක්‍රියාත්මක වනුයේ ඒ ඒ අවස්ථාවන්හි උද්ගත වන අවශ්‍යතාවයන්ට අනුකූලව කැබිනට් මණ්ඩල තීරණ හෝ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගනු ලබන තීරණයන් මතය. මෙය අසතුටුදායක තත්ත්වයකි. විශේෂයෙන් බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ භාරධූර කාර්යයේ නිරතව සිටින නිලධාරීන්ට නීතිමය රැකවරණයක් නොමැති වීම අනතුරුදායක තත්ත්වය වනවා සේම, ඔවුනට අවශ්‍ය තොරතුරු ඇතැම් ආයතන හා පුද්ගලයින්ගෙන් ලබාගැනීමටද එය බාධාවක් වේ. එසේම පොලිසිය විසින් සිදුකරන ඇතැම් විමර්ශනයන්හිදී බුද්ධි නිලධාරීන් අධිකරණවලට කැඳවීමේදී ඔවුන්ගේ අනන්‍යතාවය සමාජයට එළි දැක්වෙන අවස්ථාවන් ද ඇත. එබැවින්, මෙම සියලු කරුණු ආවරණය වන පරිදි යෝජිත බුද්ධි සේවාව ව්‍යවස්ථාපිත පනතකින් ස්ථාපිත කිරීම අවශ්‍ය කෙරේ.

03. සන්නද්ධ හමුදා සහ පොලිස් බුද්ධි අංශ ප්‍රතිසංවිධානය කිරීම:

ඉහත පරිදි ජාතික ආරක්ෂාව සඳහා ජාතික බුද්ධි අංශයක් පිහිටුවීමෙන් පසු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ බුද්ධි අංශ ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ප්‍රතිසංවිධානය කල යුතුය. ඒ අයුරින්ම ආරක්ෂක අමාත්‍යාංශයේ දැනට ක්‍රියාත්මක ජාතික බුද්ධි ප්‍රධානී තනතුර හා බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ ක්‍රියාවලියද ප්‍රතිසංවිධානයට ලක් කල යුතුය.

04. ආරක්ෂක ලේකම්, පොලිස්පති සහ ජාතික බුද්ධි ප්‍රධානී තනතුරු:

2019.04.21 දින එල්ල වූ ප්‍රහාරය පිළිබඳව කල්වේලා ඇතිව බුද්ධි තොරතුරු ලැබී තිබියදීත්, එය වලක්වා ගැනීමට හෝ අවම කරගැනීමට නොහැකි වූයේ විශේෂයෙන් ආරක්ෂක ලේකම්වරයා සහ පොලිස්පතිවරයා එම බුද්ධි තොරතුර සම්බන්ධයෙන් අනුගමනය කල නිද්‍රාශීලි පිළිවෙත නිසා බව පෙනී ගොස් ඇත. එබැවින්, මෙම තනතුරුවලට නිලධාරීන් පත්කිරීමේදී එම විෂයය පිළිබඳ පරිනතභාවයක්, ප්‍රවීනත්වයක් සහ කැපවීමක් සහිත නිලධාරීන් පමණක් පත් කිරීමට අදාල බලධාරීන් වග බලාගැනීම අත්‍යාවශ්‍ය කරුණකි.

05. ශ්‍රී ලංකා පොලිසිය:

2019.04.21 දින එල්ල වූ ප්‍රහාරය වලක්වාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීමේ වගවීම පොලිස්පතිවරයා ප්‍රමුඛ එම ප්‍රහාරය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අපොහොසත් වූ නිලධාරීන් වෙත පැවරෙන බව පරීක්ෂණ කමිටුව ඉදිරියේ අනාවරණය වූ සාක්ෂිවලින් තහවුරු වේ. මෙම තත්ත්වය උද්ගත වීමට බලපෑ කරුණු අතර, ශ්‍රී ලංකා පොලිසියේ පරිපාලන ව්‍යුහයේ පවත්නා අඩුපාඩු රැසක්ද එයට හේතු වී ඇති බව පෙනී යන ලදී. විශේෂයෙන් මෙවැනි බුද්ධි තොරතුරක් ලද පසු පළාත්භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, දිසා භාර නියෝජ්‍ය පොලිස්පති, කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/ පොලිස් අධිකාරී, දිස්ත්‍රික්ක

භාර පොලිස් අධිකාරී/ සහකාර පොලිස් අධිකාරී සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳව පැහැදිලි චක්‍රලේඛ හෝ නියෝග දක්නට නොලැබීම විශාල අඩුපාඩුවකි. එම හේතුවෙන් කිසියම් කරුණක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී සමස්ත පොලීසිය තුලම ඒකාකාරී බවක් දක්නට නැත. උදාරහරණ: වශයෙන් 2019.04.21 දින එල්ල වූ ප්‍රහාරයට අදාල බුද්ධි තොරතුර සම්බන්ධයෙන් ඉහත නිළධාරීන් එකිනෙකා ක්‍රියාකර ඇත්තේ විවිධ ආකාරයෙනි. එයට අතිරේකව එක් එක් නිළධාරියා විසින් නිකුත් කරණු ලබන නියෝග හා උපදෙස් ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව සොයා බැලීමට විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් අනුගමනය කරන බවක්ද දක්නට නොලැබේ. එබැවින් මෙම කමිටු වාර්තාවේ සඳහන් පොලිසිය පාර්ශවයෙන් සිදුවී ඇති සියළු අඩුපාඩු මැනවින් අධ්‍යනය කර ඒවා මගහැරලීම සඳහා ක්‍රමවේද සකස් කිරීමට පොලීසිය විෂය භාර අමාත්‍යවරයා විසින් කමිටුවක් පත් කිරීමට සුදුසු බවට යෝජනා කරන්නෙමු.

06. ඉස්ලාමීය අන්තවාදය තවදුරටත් ව්‍යාප්තවීම වැලැක්වීම:

එතෙක් සම්ප්‍රදායානුකූලව ඉස්ලාම් දහම අදහමින් සහජීවනයෙන් සෙසු ජාතීන් සමඟ ජීවත් වූ මුස්ලිම් ජාතිකයින්ගෙන් කොටසක් විශේෂයෙන් තරුණ කොටසක් 80 දශකය පමණ වන විට සම්ප්‍රදායානුකූලව ඉස්ලාම් දහමට බැහැරව යමින් අන්තවාදී ආගමික අදහස් දැරීමේ ආරම්භය සිදුවිය. එලෙස ආරම්භ වූ ඉස්ලාමීය අන්තවාදය ක්‍රමානුකූලව වර්ධනය වී 2019.04.21 දින ප්‍රහාරය දක්වා එය ගමන් ගන්නා ලදී. මෙම ප්‍රහාරයන් සමඟම එයට නායකත්වය ලබාදුන් කණ්ඩායමේ නායකයින් බොහෝ දෙනෙකු ඝාතනය වුවද ඔවුන්ගේ අනුගාමිකයින් රැසක් තවමත් සමාජය තුල සැරිසරමින් සිටියි. මෙම කණ්ඩායටම අතිරේක තවත් අන්තවාදී ඉස්ලාමීය ආගමික කණ්ඩායම් කීපයක් හා ඔවුන්ගේ අනුගාමිකයින්ද විශේෂයෙන් ISIS ත්‍රස්තවාදීන් සමඟ සබඳතා පැවැත්වූ කණ්ඩායමක්ද සිටින බව පෙනී ගොස් ඇත.

ඒ අනුව දැනටමත් අන්තවාදී ආගමික අදහස් දරණ මෙවැනි පුද්ගලයින්ගේ මනස සකස් කොට අවිහිංසාවාදී පුද්ගලයින් ලෙස ඔවුන් නැවත සමාජගත කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් රජය විසින් දියත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. එසේ

නොවුවහොත්, එවැනි පුද්ගලයින්ගෙන් ඉදිරියේදී එල්ලවිය හැකි තර්ජනය අති මහත්ය. ඒ අතරතුර අලුතින් පුද්ගලයින් අන්තවාදය කරා යොමුවීම වැලැක්වීම කෙරෙහිද රජයේ ඉක්මන් අවධානය යොමු විය යුතුය. මෙම කාර්යයේදී නීතිගරුක, සාමයට ලැදි මුස්ලිම් ප්‍රජාව මෙම වැඩ පිළිවෙලට අනිවාර්යෙන්ම සම්බන්ධ කර ගත යුතුය. ඒ මන්ද යත්, මෙය ආගමික මතවාද මුල් කරගත් අන්තවාදයක් බැවින්, එය සමනය කිරීමේ හැකියාව වැඩි වශයෙන් ඇත්තේ ඉස්ලාමීය පූජකවරුන්ට වන බැවින්, ඉස්ලාමීය අන්තවාදය තවදුරටත් ව්‍යාප්තවීම වැලැක්වීම සඳහා රජය වහ වහා සක්‍රීය ක්‍රියාමාර්ගයකට අවතීර්ණයවීමේ දැඩි අවශ්‍යතාවය මෙම අවස්ථාවේදී පැන නැගී ඇත.

07. සමාජ මාධ්‍ය ජාලවල ක්‍රියාකාරිත්වය:

2019.04.21 වැනි දින ප්‍රහාරයට නායකත්වය සැපයූ සහරාන් ඔහුගේ මතවාදය ප්‍රචාරය සඳහා සම්පූර්ණයෙන්ම භාවිතා කරන ලද්දේ සමාජ ජාලයන්ය. මෙය ඔහු විසින් 2017 පමණ සිට ආරම්භ කරන ලද අතර, ඒ තුලින් 2019 වර්ෂය වන විට ඔහු ආත්ම ඝාතකයින් පිරිසක් පවා ගොඩනඟා ගැනීමට සමත් විය. එයට අතිරේකව අනුගාමිකයින් රැසක් ද ගොඩනඟා ගැනීමට සමත් වී ඇත. මේ අන්දමින් සහරාන් පමණක් නොව ඉස්ලාම් අන්තවාදය පතුරුවා හරිනු ලබන තවත් සංවිධාන සහ පුද්ගලයින් බොහෝ දෙනෙකු අන්තර්ජාලය තුල දක්නට ලැබෙන හෙයින්, ආගමික අන්තවාදය තව දුරටත් ව්‍යාප්තවීම වැලැක්වීමේ වැඩ පිළිවෙල තුලදී සමාජ මාධ්‍ය ජාලාවල මෙම ක්‍රියාකාරිත්වය පාලනය සඳහාද ක්‍රියාමාර්ගයන් අනුගමනය කල යුතුමය.

මෙවැනි සිදුවීමක් හටගත් අවස්ථාවකදී සමාජ මාධ්‍ය ජාලවලට මෙන්ම අනෙකුත් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යන් විසින් ද ඉටු කළ යුතු වගකීම් සහ යුතුකම් රාශියක් ඇත. සිද්ධිය පිළිබඳව තොරතුරු ඉතා ඉක්මණින් ජනතාව වෙත ඉදිරිපත් කිරීම මාධ්‍යයේ කාර්යය භාරය වුවද, මෙවැනි අතිශයින් සංවේදී කරුණක් පිළිබඳව තොරතුරු වාර්තා කිරීමේදී සැම විටම නිවැරදි හා මධ්‍යස්ථ තොරතුරු ජනතාවට ඉදිරිපත් කිරීම ඔවුන්ගේ පරම යුතුකම විය යුතුය. එසේ නොමැතිව නිවැරදි නොවන තොරතුරු සන්නිවේදනය කිරීමෙන් ජාතික ආරක්ෂාවට මෙන්ම ජාතීන් අතර සහජීවනයටත් සිදුවිය හැකි

විනාශය පිළිබඳව ඔවුන් සැම විටම අවබෝධ කරගත යුතුය. මෙය සියළු මාධ්‍යයන් සතු ජාතික යුතුකමකි.

එමෙන්ම මෙවැනි අවස්ථාවකදී විවිධ කටකතා පැතිර යාමත් එමගින් ජනතාව නොමඟ යාමත් බොහෝවිට ප්‍රායෝගිකව සිදුවන්නකි. 2019.04.21 දින එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන්ද එම ප්‍රහාරය එල්ලවූ මොහොතේ සිට විවිධ කටකතා පැතිර යාමට පටන් ගති. එහිදී එකී කටකතාවන්ගේ නිවැරදි තත්ත්වය ජනතාවට පැහැදිලි කරදීම මාධ්‍ය සතු යුතුකමක්ව පැවතියත්, එම කාර්යය එම අවස්ථාවේදී කෙතරම් දුරට සාර්ථකව ඉටුවූයේද යන්න සිතා බැලිය යුතුව ඇති කරුණකි. එබැවින් එවැනි අවස්ථාවකදී විශේෂයෙන් රජයේ මාධ්‍ය ආයතනයන්ට පැතිර යමින් පවත්නා කටකතාවල නිවැරදි තත්ත්වය පැහැදිලි කරදීම සම්බන්ධයෙන් විශාල කාර්යය භාරයක් ඉටු කිරීමට ඇත.

තවද මෙවැනි සිදුවීමක් හටගත් විගස ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ජනතාවට නිවැරදි තොරතුරු ලබාදීම උදෙසා පැය 24 මුළුල්ලේ ක්‍රියාත්මක වන විශේෂ මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කළ යුතුය. මහජනතාවට තොරතුරු ලබාදීමට සහ ලබාගැනීම සඳහාම වෙන්වූ විශේෂිත දුරකථන අංක, ෆැක්ස් අංක සහ විද්‍යුත් තැපැල් ලිපියනයන් ලබා දිය යුතුය. සිදුවීම පිළිබඳ නිවැරදි තොරතුරු ඉතා ඉක්මණින් ආයතවලින් ලබාගෙන ජනතාව දැනුවත් කිරීමට පියවර ගත යුතුය. බොහෝවිට සිදුවනුයේ රජයේ මාධ්‍යට පෙර පෞද්ගලික මාධ්‍ය ආයතන එකී තොරතුරු විකාශය කරන බැවින් මහජනතාවගේ වැඩි අවධානය පෞද්ගලික මාධ්‍ය ආයතන වෙත යොමුවන බවත්, එබැවින් එම මාධ්‍ය ආයතනවලින් ලබාදෙන පණිවුඩ මද වේලාවකින් ජනගත වන බවත්ය. මෙම තත්ත්වය මඟහැරලීමටනම් මෙවැනි සිදුවීමකදී ඒ පිළිබඳව නිවැරදි තොරතුරු මහජනතාවට නොපමාව ලබාදීම සඳහා රාජ්‍ය මාධ්‍ය ආයතන වඩාත් කැපවීමෙන් සහ කාර්යක්ෂම ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරනු ලබයි.

එමෙන්ම මෙවැනි හදිසි අවස්ථාවකදී රජයේ මාධ්‍ය ආයතනවලට මෙන්ම ත්‍රිවිධ හමුදා සහ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරුන්ටද විශාල කාර්යය භාරයක් ඉටු කිරීමට ඇත. මන්ද යත්, සිද්ධිය පිළිබඳ වඩාත් නිවැරදි සහ නවතම තොරතුරු සතු වනුයේ ඒ පිළිබඳ විමර්ශනය කරනු ලබන විමර්ශන නිලධාරීන් අත වීමෙනි. එබැවින් ඔවුන් ලබාගන්නා

තොරතුරු අතරින් ජනතාවට එළි කළ හැකි කරුණු නොපමාව ලබාදී ජනතාව දැනුවත් කිරීම, නොයෙකුත් කටකතා සහ අසත්‍ය ප්‍රචාර පැතිර යාම වලක්වාගැනීමට ඉවහල් වනු ඇත. මෙහිදී අවධාරණය කළ යුතු වැදගත්ම කරුණක් වනුයේ, සියළුම මාධ්‍ය ප්‍රකාශකවරුන් සහ රජයේ මාධ්‍ය ආයතනවලින් නිකුත් කරනු ලබන නිවේදන එක හා සමාන වීමය. එසේ නොමැතිව ඔවුන්ගේ නිවේදනයන්හි පරස්පර විරෝධීතාවයන් ඇති වුවහොත් ඔවුන් සියළු දෙනා ප්‍රතික්ෂේප කිරීමට ජනතාව පෙළඹීම නොවැලැක්විය හැකි කරුණක් වනු ඇත.

තවද මෙවැනි අවස්ථාවකදී මෙම සිද්ධිය පිළිබඳව ක්‍රියාකළ යුතු අන්දමේ ඇති වැදගත්කම පිළිබඳව සලකා බලා සියළු ජනමාධ්‍යන්ට ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීමද අත්‍යාවශ්‍ය කරුණකි. එසේ නොමැතිව මෙවන් අවස්ථාවකදී කිසියම් මාධ්‍ය ආයතනයක් නොසැලකිලිමත් අන්දමින් හෝ වගකීමෙන් තොරව ක්‍රියාකිරීම නිසා හෝ යම් පුවතක් අනෙකුත් මාධ්‍යන්ට ප්‍රථමයෙන් තම මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීමට මාධ්‍ය ආයතන අතරේ පවත්නා තරඟය නිසා හෝ වැරදී හෝ, මහජනයා නොමඟ යවනසුළු හෝ ප්‍රකෝප කරවනසුළු පුවතක් පළ කලහොත්, ඇතැම් විට එයින් සිදුවිය හැකි විනාශය මුල් සිද්ධියෙන් ඇතිවූ විනාශයටත් වඩා විශාල වීමටත් ඉඩ ඇත. එබැවින්, 2019.04.21 දින එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය අවස්ථාවේදී සහ විශේෂයෙන් ඉන්පසු ඇතැම් මාධ්‍ය ආයතන ක්‍රියා කළ අන්දම මෙරට මාධ්‍ය ආයතන සඳහා ආචාර ධර්ම පද්ධතියක් පැවතීමේ දැඩි අවශ්‍යතාවය මැනවින් පිළිබිඹු කළ බව පෙනී ගොස් ඇත.

08. නීතිමය ප්‍රතිපාදන:

ආගමික අන්තවාදය පැතිරයාම වැලැක්වීමට නම් ඒ සඳහා අනිවාර්යයෙන්ම ශක්තිමත් නීති පද්ධතියක් තිබිය යුතුය. විශේෂය අන්තවාදය පතුරුවා හරිනු ලබන ආගමික සංවිධාන පාලනය කිරීමටත්, දැනටමත් විවිධ අන්තවාදී ආගමික කණ්ඩායම් විසින් ආගමික වශයෙන් මනස වියවුල් කරනු ලැබූ අයවලුන් එම තත්ත්වයෙන් මුදවාගැනීම සඳහා පුනරුත්ථාපන වැඩ සටහන් වැනි වැඩ සටහන් පවත්වා ගෙන යාමටත්, විවිධ වැරදි සිදු කරනු ලබන පුද්ගලයින් අත් අඩංගුවට ගෙන නීතිමය පියවර ගැනීමටත්,

අන්තවාදයට ආධාර අනුබල දෙන අයවලුනට දඬුවම් පැමිණවීමටත් ශක්තිමත් නීති පද්ධතියක් නොපමාව සකස් කල යුතුය. මේ වන විට හදිසි නීතිය යටතේ යම් යම් ක්‍රියාමාර්ග ගෙන ඇතත් එය තාවකාලික පියවරක් පමණක් වන බැවින්, ඒ වෙනුවට ස්ථිර නීති පද්ධතියක් සකස් කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පෙනී ගොස් ඇත.

09. 2019.04.21 දින ප්‍රහාරයට ලක්වූ වින්දිතයින්ගේ සුභසාධනය:

මෙම ත්‍රස්ත්‍රවාදී ප්‍රහාරය නිසා 259 ක් පමණ පිරිසක් මියගිය අතර 479 දෙනෙකු පමණ තුවාල ලැබූහ. ඒ අනුව මියගිය අයවලුන්ගේ පවුල්වල ඉතිරිවී සිටින සාමාජිකයින්ගේ ඉදිරි දිවිපෙවෙත යහපත්ව ගතකිරීමට අවශ්‍ය පරිසරය හා පහසුකම් ඔවුනට ලබාදීම සඳහා ඉක්මන් වැඩ පිලියෙලක් දියත්කල යුතුවේ.

එසේම ප්‍රහාරයෙන් තුවාල ලැබූ ඇතැම් පිරිස් තවමත් රෝහල් ගතව සිටින අතර ඔවුනට වෛද්‍ය පහසුකම් සලසා ගැනීමේදී ආර්ථික ප්‍රශ්ණ වලට මුහුණ දීමට සිදුවන බව පෙනී ගොස් ඇත. ඇතැම් පරීක්ෂණ හා ප්‍රතිකාර සඳහා රජයේ රෝහල් වලදී පවා බිල්පත් ගෙවීමට සිදුවීමෙන් ඔවුන් අපහසුතාවයට පත්වන බවට තොරතුරු කමිටුවට ඉදිරිපත් විය. එබැවින් මෙම තත්ත්වය මඟ හරවා තුවාල කරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර බාධාවකින් තොරව ලබාදීම කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

තවද, ඇතැම් තුවාලකරුවන්ට රෝහලෙන් පිටවයාමෙන් පසු දීර්ඝකාලීනව ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන අයවලුන්ද සිටියි. එබැවින් ඔවුන් කෙරෙහිද විශේෂයෙන් පූර්ණකාලීනව ආබාධිත තත්ත්වයට පත්වූවන් සඳහා ඉදිරි ජීවන මාර්ගයන් සකසාදීමේ වැඩපිලිවෙලක්ද සකස් විය යුතුය.

මෙම සියළු කරුණු වලට අතිරේකව ප්‍රහාරයෙන් මානසික කම්පනයට පත්ව සිටින එම පවුල්වල සාමාජිකයින්ගේ විශේෂයෙන් දැරුවන්ගේ මානසික තත්ත්වය නැවත ගොඩ නැගීම සඳහා විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමද අත්‍යාවශ්‍ය කරුණක්ව පවතියි. එමෙන්ම ප්‍රහාරයට ගොදුරු වූ පවුල්වල පාසැල් දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු

බාධාවකින් තොරව ඔවුන්ට කරගෙන යාමට හැකි පරිසරයක් නිර්මානයකර දීමද අත්‍යාවශ්‍යයය.

10. ඉස්ලාම් දහම ඉගැන්වීම සඳහා ඇති පාසැල් නියාමනය:

ඉස්ලාම් දහම ඉගැන්වීම සඳහා මේ වනවිට දිවයින තුල ක්‍රියාත්මක වන ප්‍රධාන පාසැල් වර්ග 03 ක් පිළිබඳව හඳුනා ගෙන ඇත. එනම්,

i අහදියා පාසැල්

ii කුරාන් මද්රසා පාසැල්

iii මද්රාසා පාසැල් නොහොත් ආරාබි පාසැල්.

මෙම එක් එක් පාසැලකින් සිදුකරණු ලබන ආගමික අධ්‍යාපන කටයුතු පිළිබඳව මෙම කමිටු වාර්තාවේ මීට පෙර සඳහන් වන බැවින් ඒ ගැන නැවත දීර්ඝ විස්තරයක් සිදු කිරිම අනවශ්‍ය යයි අදහස් කෙරේ.

කෙසේ වෙතත් මෙම එකදු ආගමික පාසැලක් රජයේ කිසිදු ආයතනයකින් නිසි ලෙස නියමනය නොවන බව පෙනේ. උදා: වශයෙන් ඉහත සඳහන් පාසැල් අතරින් ඉහලම ආයතනය වන්නේ මද්රාසා පාසැල් නොහොත් අරාබි පාසැල්ය. මෙවැනි පාසැල් දැනට 317 ක් දිවයින පුරා පිහිටා ඇත. මෙම මද්රසා පාසැල් 1986 ට පෙර අධ්‍යාපන අමාත්‍යාංශ්‍ය යටතේ පැවති නමුත් 1986 න් පසු එය එම අමාත්‍යාංශයෙන් ඉවත් කොට මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය යටතට පවරා ඇත. එහෙත් මෙම මද්රසා පාසැල් ලියාපදිංචි කිරීමේදී මෙන්ම ඒවායේ සිදුකරනු ලබන අධ්‍යාපන කටයුතු නියාමනය සඳහා රජයේ පාර්ශවයෙන් විධිමත් වැඩපිළිවෙලක් පවත්නා බව දක්නට නැත. අවම වශයෙන් මෙම පාසැල් සඳහා නිශ්චිත විෂය නිර්දේශයක් හෝ නොමැති බව අනාවරණය විය. මෙම තත්වය වඩාත් බරපතල වනුයේ මුස්ලිම් දහමට අනුව මවුලවී පදවි පිරිනමනුයේ මෙම මද්රාසා පාසැල් වල පවත්වනු ලබන විභාගය සමත් වන අයවළුනට වීමය. එසේම මෙම මවුලවි විභාගය සමත්වීම රජය විසින් පිරිනමනු ලබන මුස්ලිම් ගුරුපත්වීම් ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය එක් මූලික සුදුසු කමක් ලෙසටද සලකනු ලැබේ. සෙසු ආගමික පාසැල් දෙවර්ගය වන කුරාන් මද්රසා පාසැල් හා අහදියා පාසැල් වල නියාමනය පිළිබඳ තත්වයද මෙලෙසම වන බැවින්

1986 ට පෙර පැවති පරිදි සියළුම මද්රසා පාසැල් නැවත අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා ගැනීමටත් සෙසු ආගමික පාසැල් නියාමනය සඳහාත් විධිමත් වැඩ පිලිවෙලක් සකස් කිරීම තුලින් ඉස්ලාමීය ආගමික අන්තවාදය තවදුරටත් මුස්ලිම් ප්‍රජාව තුල ව්‍යාප්තවීම වලක්වා ගැනීමට හැකි වනු ඇති බවට කමිටුව යෝජනා කරයි.

11. මුස්ලිම් දේවස්ථාන අළුතින් ඉදිකිරීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොතිබීම:

මේ වනවිට දිවයින තුල මුස්ලිම් දේවස්ථාන 2599 ක් මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලියා පදිංචි වී ඇත. මුස්ලිම් දේවස්ථානයක් අළුතින් ඉදිකිරිමේදී එයට අනුමැතිය ලබා ගැනිම සඳහා දැනට අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගය වනුයේ ප්‍රථමයෙන් දේවස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අදාල පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමත්, වකුෆ් මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගැනීමත්ය. එහිදී මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වනුයේ අයදුම්කරු සහ වකුෆ් මණ්ඩලය අතර ලිපි ගොනුව හුවමාරු කටයුතු සිදුකිරීම පමණි. මෙය සාර්ථක ක්‍රමවේදයක් නොවන බැවින් ඒ සඳහා වඩාත් සුදුසු කාර්ය පටිපාටියක් සකස් කිරීම මණ්ඩලයේ නිර්දේශයයි.

12. සියළු ආගම් සඳහා ආගමික කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවීම:

දැනට වසර කීපයකට පෙර සියළු ආගම් සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීම සඳහා වූයේ ආගමික කටයුතු අමාත්‍යාංශය නමින් එක් අමාත්‍යාංශයක් පමණි. නමුත් පසු කාලීනව එම තත්ත්වය වෙනස්වී මේ වන විට එක් එක් ආගම් සඳහා බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් කටයුතු යනුවෙන් වෙන් වෙන් වශයෙන් අමාත්‍යාංශ හතරක් පවත්වා ගෙන යනු ලබයි. මෙම තත්වය යටතේ සියළු ආගම්වලට බලපාන යම් යම් පොදු කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී විවිධත්වයක් එම තීරණ වල ඒකාකාරී බවක් නොතිබීම හේතු කොට ගෙන අර්බුද පැන නැගුන අවස්ථා නිරීක්ෂණය කරන ලදී. උදා: වශයෙන් අළුතින් ආගමික ස්ථානයක් පිහිටුවීමේදී ඒ සඳහා අනුගමනය කලයුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් සියළු ආගම් වලට පොදු වූ ක්‍රමවේදයක් දක්නට නොවීය. එය ජාතීන් හා ආගම් අතරෙහි ගැටුම්කාරී තත්වයක් නිර්මානයවීම දක්වා දුරදිග ගමන්කල අවස්ථාවන්ද, එමගින් ආගමික සහ ජාතික සමගියට විශාල හානියක් සිදුවන බවත් පෙනේ. එබැවින් මෙරට පවත්නා සියළු ආගම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට

ආගමික කටයුතු අමාත්‍යාංශය නමින් එක් අමාත්‍යාංශයක් පිහිටුවා එහි ලේකම්වරයා යටතේ එක් එක් ආගම් වෙනුවෙන් අධ්‍යක්ෂ වරයෙකු බැගින් පත්කිරීමට සුදුසු බවට යෝජනා කර සිටිමු.

13. ජාතීන් හා ආගම් අතර ස්ථිරසාර සහජීවනයක් ගොඩනැගිම.

2019.04.21 දින එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය හේතු කොට ගෙන මුස්ලිම් සහ අනෙකුත් ජන කොට්ඨාශ අතරෙහි එතෙක් පැවති සහජීවනය යම් ප්‍රමාණයකට පළුදුවී ඇති බව පෙනේ. මෙම තත්ත්වය නොපමාව සමනය කොට ජාතීන් අතරෙහි බිඳීගිය විශ්වාසය නැවත ගොඩ නැගීමට ඉක්මන් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවුන හොත් මුස්ලිම් හා අනෙකුත් ප්‍රජාව තවදුරටත් දිනෙන් දින දුරස්ථවී ඔවුන් නැවත එක්කල නොහැකි ප්‍රමාණය දුරස්ථ වනු ඇත. එසේ වුවහොත් එය ත්‍රස්තවාදීන් ලද විශාල ජයග්‍රහනයක් වනුයේ එවැනි මුස්ලිම් ප්‍රජාවන් තම සංවිධානය වටා එක්රැස්කර ගැනීමට ඔවුනට එය මහඟු පිටුවහලක් වන හෙයිනි.

මෙලෙස ජාතින් අතර සහජීවනය ගොඩ නැගීමේදී මුස්ලිම් පාර්ශවයෙන් ඔවුන්ගේ ආගමික නායකයින්ට මෙන්ම ප්‍රජා නායකයින්ටද අනෙකුත් ආගමික නායකයින්ටද විශාල කාර්යභාරයක් ඉටුකිරීමට ඇත. මෙම සියළු කාර්යයන්හි සාර්ථකත්වය රඳා පවතිනු ඇත්තේ රජය සහ සියළු දේශපාලන පක්ෂ ඒ සඳහා අවංකව කැපවීමෙන් ක්‍රියාකිරීමෙන් පමණි. මෙම තත්ත්වය කෙරෙහි අදාල පාර්ශවයන් දැඩි අවධානය යොමු කර වහාම පියවර ගත යුතුය.

14. සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාවගේ ආරක්ෂාව:

මෙරට මුස්ලිම් ජනතාව අතරින් අන්තවාදයට යොමු වී ඇත්තේ සුළු පිරිසක් බවත්, බහුතර ජනතාව සම්ප්‍රදානුකූලව ඔවුන්ගේ ආගමික කටයුතුවල නිරත වෙමින් සාමකාමීව ජීවත්වීමට කැමැත්තක් දක්වන පිරිසක් බවත් පෙනී යයි. එහෙත් මෙහිදී නිරීක්ෂණය වන බරපතල තත්ත්වයක් වනුයේ අන්තවාදයට නැඹුරු වූ මෙම කුඩා පිරිසගෙන් එල්ල වන තර්ජන හමුවේ බහුතර මුස්ලිම් ජනතාව ඔවුනට විරුද්ධව ප්‍රසිද්ධියේ නැඟී සිටීමට ඉදිරිපත් නොවන බවය. මෙයට හොඳම එක් උදාහරණයක් වනුයේ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ නායකයාව සිට පසුගිය අප්‍රේල් 21වැනි දා

සිදු කළ ප්‍රහාරයේදී දිවි නසා ගත් සහරාන් නැමැත්තා 2017 වර්ෂයේ මඩකලපුව, කාත්තන්කුඩි ප්‍රදේශයේ දී සිය අනුගාමිකයින්හට පවත්වනු ලැබූ දේශනයකට විරුද්ධ වූ මුස්ලිම් කණ්ඩායමට සහරාන්ගේ පාර්ශ්වයෙන් දරුණු ප්‍රහාරයක් එල්ලවීම පෙන්වා දිය හැක. එබැවින් ඉස්ලාම් අන්තවාදය තවදුරටත් ව්‍යාප්තවීම වැලැක්වීම සඳහා සාමකාමී මුස්ලිම් ප්‍රජාවගේ සහාය ලබාගැනීම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩ පිළිවෙලක් රජය මගින් දියත් කළ යුතුය.

15. පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම:

පුපුරණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඇතුළු එම විෂයට අදාල කාර්යයන් සිදු කරනු ලබන්නේ ආරක්ෂක අමාත්‍යාංශය විසිනි. මෙහිදී වර්තමානයේ අනුගමනය කරනු ලබන ක්‍රමවේදයෙහි අඩුපාඩු රැසක් පවත්නා බව නිරීක්ෂණය විය. විශේෂයෙන් පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රලාභීන් වෙත නිකුත් කිරීමෙන් පසු ඒවා අදාල කාර්යය සඳහා පමණක් පාවිච්චි වන්නේද යන්නත්, එම පුපුරණ ද්‍රව්‍ය වෙනත් පාර්ශ්වයන් අතට පත්වනනේද යන්නත් පරීක්ෂා කර නියාමනය සඳහා විධිමත් ක්‍රියා මාර්ගයක් අනුගමනය නොකරන බව පෙනී ගොස් ඇත. 2019.04.21 වන දින එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනය අතරතුරදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සමන්තුරේ ප්‍රදේශයේදී ත්‍රස්තවාදීන්ගේ ආරක්ෂක නිවසක තිබී සොයාගත් පුපුරණ ද්‍රව්‍ය වලින් කොටසක් ත්‍රස්තවාදීන් විසින් මිලදී ගෙන ඇත්තේ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර හිමි ව්‍යාපාරිකයෙකුගෙන් බවට තහවුරු වී ඇත. එබැවින් පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අලුතින් නිකුත් කිරීමේදීත්, බලපත්‍රලාභීන්ට පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීමේදීත්, එසේ නිකුත් කිරීමෙන් පසු ඒවා පාවිච්චි කරන අන්දම පිළිබඳවත් සොයා බැලීමට දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංවිධානය කොට වඩාත් කාර්යක්ෂම කාර්ය පටිපාටියක් ඒ සඳහා අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

16. 2019.04.21 දින ප්‍රහාරයට යොදා ගන්නා ලද බෝම්බ සෑදීමට උපයෝගී කරගත් අනිකුත් ද්‍රව්‍ය පිළිබඳ නියාමනය.

2019.04.21 දින එල්ල කළ ආත්ම ඝාතක බෝම්බ සියල්ලම සෑදීම සඳහා අවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය සාදාගෙන ඇත්තේ ප්‍රධාන වශයෙන් නයිට්‍රික් ඇසිඩ් සහ යූරියා නැමැති

රසායනික ද්‍රව්‍ය දෙක උපයෝගීකර ගනිමින් බව විද්‍යාත්මක සාක්ෂිවලින් අනාවරණය වී ඇත.. මෙම නයිට්‍රික් හා යූරියා වැනි රසායන ද්‍රව්‍යයන් වෙළඳ පොළෙහි කිසිඳු බාධායකින් තොරව මිලදී ගත හැකි ද්‍රව්‍යයන්ය. එබැවින් කිසියම් ත්‍රස්තවාදී කණ්ඩායමකට ඉදිරියේදී වුවද මෙම රසායන ද්‍රව්‍ය උපයෝගී කරගෙන යම් විනාශකාරී ක්‍රියාවක් කිරීමේ හැකියාව පහසුවෙන්ම ඇත. එබැවින් මෙම රසායනික ද්‍රව්‍ය අලෙවි කිරීමේදී කිසියම් නියාමනයකට යටත්ව සිදු කිරීමත්, විශේෂයෙන් එම ද්‍රව්‍ය අලෙවි කරනු ලබන වෙළඳ ආයතන මෙම තර්ජනය පිළිබඳව දැනුවත් කොට එම ද්‍රව්‍ය මිලදී ගන්නා පුද්ගලයින් පිළිබඳව අවධානයෙන් සිටින ලෙසට උපදෙස් දීමටත් සුදුසු වේ.

ඉහත ප්‍රහාරයන් සඳහා උපයෝගී කරගන්නා ලද බෝම්බ සෑදීමේදී ඒවා තුලට විවිධ ප්‍රමාණයේ ලෝහ බෝල රාශියක්ද ඇතුල් කර තිබී ඇත. එහිදී එක් බෝම්බයකට ලෝහ බෝල දහස් ගණනක් යොදා තිබීම පිපිරීමෙන් සිදුවූ ජීවිත හානි සහ තුවාලකරුවන් ගණන ඉහළ යාමට හේතු වී ඇත. මෙම කුඩා ප්‍රමාණයේ ලෝහ බෝලද (පාපැදිවල රේසර්වලට යොදන ලෝහ බෝල වැනි) වෙළඳ පොළේ අවශ්‍ය තරම් කිසිම බාධායකින් තොරව මිලදී ගත හැකි බැවින් එයද ඉදිරියේදී අනතුරුදායක තත්ත්වයකි. එබැවින් මෙවැනි ලෝහ බෝල අලෙවි කිරීම නියාමනය සඳහා යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කෙරේ.

17. කුඩා ප්‍රමාණයේ රහසිගත රසායනාගාර (Clandestine Labs) :

2019.04.21 එල්ල වූ ප්‍රහාරයට යොදා ගන්නා ලද බෝම්බ සකස් කිරීමේදී එයට අවශ්‍ය ඇතැම් රසායන ද්‍රව්‍ය ත්‍රස්තවාදීන් විසින් තම ආරක්ෂක නිවාසයන් තුළ (safe houses) කුඩා ප්‍රමාණයේ රහසිගත රසායනාගාර ඉදිකොට ඒවා තුළින් එම රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කොට ඇති බව පෙනී ගොස් ඇත. එබැවින් නිවාස ඇතුලු විවිධ ස්ථානවල තිබිය හැකි මෙවැනි රහසිගත කුඩා ප්‍රමාණයෙන් රසායනාගාර පිළිබඳව ආරක්ෂක අංශයන් මෙන්ම ජනතාවද දැනුවත් කිරීම වැදගත් වේ.

18. වීසා සහ පුරවැසිභාවය ලබාදීමේ ක්‍රමවේදය:

මෙරටට ඇතුළු වන විදේශිකයින්ට වීසා ලබාදීමේදී පසුගිය කාල පරිච්ඡේදය තුල ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කළ සැහැල්ලු ක්‍රමවේදයද

ඉස්ලාමීය අන්තවාදය මෙරට තුල ප්‍රචලිතවීමට බලපෑ එක් කරුණක් බවට හඳුනාගෙන ඇත. විශේෂයෙන් අනුගමනය කළ ගුවන් තොටුපලට පැමිණීමෙන් පසු වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය (On arrival Visa) මෙයට බෙහෙවින් බලපා ඇත. එම ක්‍රමවේදය තුලින් ගත වූ වසර කිහිපය තුල විදේශීය ඉස්ලාමීය දේශකයින් විශාල සංඛ්‍යාවක් මෙරට පැමිණෙන විවිධ ඉස්ලාමීය අන්තවාදී දේශනයක් දිවයිනේ බොහෝ ප්‍රදේශවල පවත්වා ඇති බව අනාවරණය. මෙවැනි ඇතැම් දේශකයින් මද්‍රසා පාසල්වලද දේශන පවත්වා ඇති බව පෙනී යයි. බුද්ධි අංශවල මැදිහත්වීම මත මෑතක සිට මෙම ක්‍රමවේදයේ යම් යම් වෙනස් කම් සිදු කිරීමෙන් පසු විදේශීය දේශකයින් පැමිණීමේ ප්‍රවණතාවයේ කිසියම් අඩුවීමක් දක්නට ඇතත් මේ සඳහා ස්ථිර ක්‍රමවේදයක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

තවද මද්‍රාසා පාසල්වල අධ්‍යාපනය ලැබීමට ඇතැම් විදේශීය සිසුන්ද පැමිණෙන බවත්, ඔවුනට වීසා ලබාදීමේදීද නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකරන බවත් අනාවරණය විය. වීසා ලබාදීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය ප්‍රතිසංවිධානයට ලක් කළ යුතුය.

එසේම ආගමන විගමන දෙපාර්තමේන්තුවත්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා පොලිසියත් සතු විවිධ දත්ත එකම පරිගණක ජාලයකට ගොනු කර ඒ ඒ ආයතන අතරෙහි බෙදා ගැනීමේ ක්‍රමවේදයක් වර්තමානයේ නොතිබීම විශාල අඩුපාඩුවත් බවත්, එම හේතුවෙන් විවිධ අපරාධවලට සම්බන්ධ පුද්ගලයින්ට පහසුවෙන්ම දිවයිනෙන් බැහැර යාමට සහ ඇතුල්වීමට හැකි වී ඇති බවත් අනාවරණය විය. එබැවින් ඉහත සඳහන් ආයතන සතු දත්ත එකම පරිගණක ජාලයකට ගොනුකර ඒ ඒ ආයතන අතරෙහි බෙදා ගැනීමේ ක්‍රමවේදයක්ද නොපමාව සකස් කිරීම අවශ්‍ය කෙරේ.

19. ප්‍රජා කමිටු ප්‍රතිසංවිධානය කිරීම:

ශ්‍රී ලංකා පොලිසිය විසින් පොලිස් ස්ථාන මට්ටමින් දිවයිනේ සියලුම ග්‍රාමසේවා වසම් ආවරණය වන පරිදි ප්‍රජා කමිටු 14022 ක් පිහිටුවා ඇති බව මෙම මණ්ඩලයට අනාවරණය විය. ප්‍රජා කමිටු පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ පොලිස් මහජන

සම්බන්ධතාවය පවත්වාගෙන යාමය. එසේම ඒ ඒ ප්‍රදේශවල සිදුවන නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියා මෙන්ම අපරාධ පිළිබඳ තොරතුරු මෙම කමිටු මගින් ලබාගැනීමත් ඒ තුළින් අපරාධ මර්ධන ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස පවත්වාගෙන යාමත් අපේක්ෂිතය.

මෙම මණ්ඩලයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව 2019.04.21 දින ප්‍රහාරයට සම්බන්ධ වූ ත්‍රස්තවාදීන් එම ප්‍රහාරයට මාස කිහිපයකට පෙර සිට මීගමුවේ කටුවාපිටිය, පානදුර කෙසෙල්වත්ත, ගල්කිස්ස සහ වත්තල වැනි ප්‍රදේශයන්හි නිවාස කුලියට ගෙන පදිංචිව සිටිමින් මෙම ප්‍රහාරය සැලසුම් කළ බවට අනාවරණය වී ඇත. විශේෂයෙන් මීගමුවේ කටුවාපිටිය ප්‍රදේශයෙන් ලබාගත් නිවසට ඔවුන්ගේ කණ්ඩායම සහ පවුලේ සාමාජිකයින් නිතර ආගිය බවත්, ප්‍රහාරයට පාවිච්චි කළ බෝම්බවල ඇතැම් කොටස් සකස් කිරීම පවා මෙම නිවාස තුළදී සිදු කර ඇති බවත් පෙනී ගොස් ඇත. එමෙන්ම පානදුර කෙසෙල්වත්ත ප්‍රදේශයෙන් ලබාගත් නිවස තුළද ප්‍රහාරයට ප්‍රථම මාස කිහිපයක් ඔවුන්ගේ සාමාජිකයින් වරින් වර පදිංචිව සිට ඇති බවත්, ප්‍රහාරයට සම්බන්ධවී මියගිය ත්‍රස්තවාදීන් වැඩි දෙනෙකු ප්‍රහාරයට පෙර දින මෙම නිවසට එක්රැස්වී සිට ඇති බවත් පෙනේ. තත්ත්වය එසේ තිබියදී මෙම ත්‍රස්තවාදීන් පිළිබඳව කිසිඳු තොරතුරක් ප්‍රජා කමිටු ඔස්සේ හෝ ලබාගැනීමට අදාල පොලිස් ස්ථාන අසමත් වීමෙන් පෙනී යනුයේ ප්‍රජා පොලිස් කමිටු සංකල්පයෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බවය. මේ සම්බන්ධයෙන් මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දෙනු ලැබූ බස්නාහිර පළාත උතුර භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා සඳහන් කර සිටියේ ඔහු විසින් ප්‍රජා පොලිස් සංකල්පය පිළිබඳව කැලණිය විශ්ව විද්‍යාලය මගින් සිදු කරන ලද සමීක්ෂණයකදී එම සංකල්පය අසාර්ථක බවට එම විශ්ව විද්‍යාලයීය සමීක්ෂණ මණ්ඩල මණ්ඩලය විසින් ද වාර්තා කර ඇති බවය. එබැවින් ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා පොලිස් ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කළ යුතු බව පෙනී යයි.

20. **ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම:**

රාජ්‍ය බුද්ධි සේවාව සහ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු අනෙකුත් බුද්ධි අංශ මගින් එක්රැස් කරනු ලබන බුද්ධි තොරතුරු පිළිබඳ සාකච්ඡා කර සම්බන්ධීකරණය කිරීමටත් ජාතික ආරක්ෂාවට අදාල අනෙකුත් කරුණු පිළිබඳවත් සාකච්ඡා කිරීමටත් ආරක්ෂක අමාත්‍යාංශය විසින් සෑම සතියකම අඟහරුවාදා දින බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමක් පවත්වනු ලැබේ. මෙම රැස්වීම ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අතර, ඔහු නොමැති අවස්ථාවන්හිදී ආරක්ෂක ලේකම්වරයා එය මෙහෙයවනු ලබයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානී, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ, යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ, නාවික හා ගුවන් හමුදාවන්හි බුද්ධි ප්‍රධානීන් සහ තවත් නිලධාරීන් කිහිපදෙනෙකු සහභාගී වේ.

2019.04.21 දින ප්‍රහාරයට ප්‍රථම 2019.04.09 දින මෙම රැස්වීම ආරක්ෂක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වී ඇති අතර, ඒ වන විට ඉහත ප්‍රහාරයට අදාල පළමුවන බුද්ධි තොරතුර රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ විසින් ජාතික බුද්ධි ප්‍රධානී වෙත යොමුකරනු ලදුව, ඔහු විසින් ඒ පිළිබඳව ආරක්ෂක ලේකම්වරයාද දැනුවත් කර තිබී ඇත. එහෙත් 2019.04.09 දින පැවැති රැස්වීමේදී මෙම බුද්ධි තොරතුර පිළිබඳව හෝ ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර හෝ පිළිබඳව කිසිවක් සාකච්ඡා වූ බවක් අනාවරණය නොවේ. මෙම රැස්වීමේ අරමුණ බුද්ධි සම්බන්ධීකරණය වුවද රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ විසින් 2019.04.07 දින ලබාදුන් ඉහත සඳහන් බුද්ධි තොරතුර ගැන අවම වශයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ත්‍රිවිධ හමුදාපතිවරුන් පවා දැනුවත් කිරීමට ආරක්ෂක ලේකම් විසින් ක්‍රියා කර නොමැත.

මෙම සියලු කරුණු අනුව අනාවරණය වූයේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් සතිපතා පවත්වනු ලබන බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම විධිමත් ක්‍රමවේදයකට අනුව පවත්වාගෙන යනු ලබන්නක් නොවන බව පෙනී ගොස් ඇත. තවද මෙම රැස්වීම හුදෙක් පරිපාලන ක්‍රියාදාමයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන්නන් වන හෙයින්, මෙම බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම නීතිමය ප්‍රතිපාදන යටතේ පවත්වාගෙන යනු

ලබන වඩාත් ශක්තිමත් ආයතනයක් බවට පත් කොට එය ඵලදායි අන්දමින් පවත්වාගෙන යාමට ක්‍රියා කළ යුතු වේ.

21. **ආරක්ෂක මණ්ඩලය:**

ජාතික ආරක්ෂාව සම්බන්ධයන් තීරණ ගන්නා මෙරට ඉහළ ආයතනය ආරක්ෂක මණ්ඩලයයි. මෙය ජනාධිපතිතුමගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන අතර, ඒ සඳහා අගමැතිතුමා, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා, ජනාධිපති ලේකම්, ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරුන්, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානීන්, රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂ, යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ යන නිලධාරීන් අනිවාර්යෙන්ම සහභාගි වන අතර, අවශ්‍යතාවය අනුව වරින් වන වෙනත් රාජ්‍ය නිළධාරීන්ද මෙම රැස්වීමට කැඳවනු ලැබේ. ආරක්ෂක මණ්ඩලය කැඳවනු ලබන්නේ ආරක්ෂක ලේකම්වරයා විසින් වන අතර, සාමාන්‍යයෙන් එය සතියකට එක් වතාවක් රැස්වේ.

මෙම ආරක්ෂක මණ්ඩලය කිසියම් නීතිමය ප්‍රතිපාදනයක් යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් නොවන බැවින්, එය පවත්වාගෙන යාමේදී ස්ථිර ක්‍රමවේදයක් අනුගමනය කරන බවක් දක්නට නොමැත. උදාහරණ වශයෙන් ආරක්ෂක මණ්ඩලය සාමාන්‍යයෙන් සතියකට වරක් රැස්වන නමුත් ඇතැම් අවස්ථාවන්හිදී මසකට වරක් හෝ රැස් නොවූ අවස්ථාවන්ද තිබී ඇත. එසේම ස්ථිර වශයෙන්ම සහභාගි විය යුතු සාමාජිකයින් කවුරුන්ද යන්න පිළිබඳවද නිශ්චිත නිගමනයක් තිබූ බවක් දක්නට නොමැත. තවද රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබන කරුණු සහ ගනු ලබන තීරණ පිළිබඳව සටහන් තබා ගැනීමක් (MINUTES) හෝ ගනු ලැබූ තීන්දු ක්‍රියාත්මක කරවීම පිළිබඳ විධිමත් සොයා බැලීමේ පසු විපරම් ක්‍රමයක් තිබූ බවක්ද දක්නට නොපෙනේ. සියළු දෑ අන්‍යෝන්‍ය විශ්වාසය මත පවත්වාගෙන යාමේ ක්‍රියා මාර්ගයකින් රැස්වීම් කටයුතු පවත්වාගෙන ගොස් ඇති බව පෙනේ. මෙම තත්ත්වය 2019.04.21 වන දින එල්ල වූ ප්‍රහාරය වලක්වාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගය ගැනීමට නොහැකිවීම කෙරෙහිද බලපා ඇති බව පෙනී යයි. එබැවින් මෙරට ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තීරණ ගන්න ඉහළම ආයතනය වන ආරක්ෂක මණ්ඩලය

නීතිමය ප්‍රතිපාදන යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයක් බවට අනිවාර්යෙන්ම පත් කළ යුතුය.

22. ජාතික ආරක්ෂාව:

2019.04.21 දින එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය වලක්වා ගැනීමට නොහැකි වූ හේතු අතර ඒ අවස්ථාව වන විට ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සියලු පාර්ශ්වයන්ගේ අවධානය ඉතා පහල මට්ටමක පැවතීම ප්‍රධාන සාධකයක් වූ බව අනාවරණය වේ. එය සනාථ වනුයේ ප්‍රහාරය පිළිබඳව පළමුවන බුද්ධි තොරතුර 2019.04.05 දිනත්, එය වඩාත් තහවුරු කරමින් 2019.04.20 දිනත් පැහැදිළි බුද්ධි තොරතුරු ලැබී තිබියදී ප්‍රහාරය වලක්වාගැනීමට නොහැකි වීමෙන්ය.

ශ්‍රී ලංකාව තුල ඉස්ලාමීය අන්තවාදය පැතිරයාම පිළිබඳ 2015 වසරට පෙර සිටද කථාබහට ලක් වූවත්, එය සනාථ කිරීම සඳහා වූ ප්‍රථම සාධකය ඉදිරිපත් වූයේ 2015 වසරේදීය. එනම් ISIS ත්‍රස්තවාදීන් සමඟ එක්ව සිටි ශ්‍රී ලාංකිකයකු 2015 වර්ෂයේදී සිරියාවේදී මියගිය බව වාර්තාවීමත් සමඟය. අනතුරුව 2017 වසරේදීද ඒ අයුරින්ම තවත් ශ්‍රී ලාංකිකයකු සිරියාවේදී මරණයට පත් වූ අතර එම වසර වන විට තවත් ශ්‍රී ලාංකිකයින් පස් දෙනෙකු ඔවුන්ගේ පවුල් සාමාජිකයින් සමඟ මුළු ගණන තිස්හතර දෙනෙකු සිරියාවට ගොස් ඇති බව බුද්ධි අංශ මඟින් අනාවරණය කර ගන්නා ලදී. මෙම ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායම්වල වර්ධනය පිළිබඳව බුද්ධි අංශ දිගින් දිගටම වාර්තා කරමින් සිටියදී, ශ්‍රී ලාංකික ඉස්ලාම් අන්තවාදී කණ්ඩායමක ප්‍රථම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව 2018.12.23 සිට 2018.12.26 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වාර්තා වේ. එනම් මාවනැල්ල ප්‍රදේශයේ බුදුපිළිම කිහිපයකටත්, මහනුවර හා රඹුක්කන ප්‍රදේශයන්හි කතෝලික සහ හින්දු ප්‍රතිමා කිහිපයකටත් අලාභ හානි සිදු කිරීමය. අනතුරුව මෙම සිද්ධීන්ට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලද විමර්ශනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් ත්‍රස්තවාදීන් විසින් සිය පුහුණු කටයුතු සඳහා මෙන්ම පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනයටත් අවි ආයුධ සඟවා තබා ගැනීමටත් භාවිතා කළ බවට නිරීක්ෂණය වන රහසිගත ස්ථානයක් 2019.01.16 දින පුත්තලමේ වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සොයා ගෙන ඇත. එසේම එම ස්ථානයේ තිබී පුපුරණ ද්‍රව්‍ය සෑදීමට ගන්නා රසායනික ද්‍රව්‍ය රාශියක්ද බෝම්බ සෑදීමට ගන්නා උපාංග ඇතුළු තවත්

සංග්‍රාමික උපකරණ රැසක්ද සොයා ගෙන ඇත. ඒ සමඟම මෙම ස්ථානය සහ මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිමවලට අලාභ හානි සිදුකළ ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායම අතර පවත්නා සබඳතාවයත්, ඔවුන් සහ ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ (NTJ) නායක මොහොමඩ් සහරාන් අතර පවත්නා සබඳතාවයත් අනාවරණය කර ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා රාජ්‍ය බුද්ධි සේවාව සමත්වී ඇත.

මෙය මොහොමඩ් සහරාන්ගේ ප්‍රධානත්වයෙන් යුත් අන්තවාදී කණ්ඩායම නුදුරු අනාගතයේදීම පුපුරණ ද්‍රව්‍ය භාවිතා කරමින් ප්‍රහාරයක් එල්ල කිරීමට සූදානම් වන බව සියළු බලධාරීන් විසින් අවබෝධ කරගත යුතුව තිබූ බරපතල අවස්ථාවකි. විශේෂයෙන් වනාතවිල්ලුවේදී සොයා ගනු ලැබූ සංග්‍රාමික උපකරණ පිළිබඳව මාධ්‍ය තුළින් පවා විශාල ප්‍රසිද්ධියක් ලබාදී තිබූ හෙයින් ඒ පිළිබඳව මෙරට පොදු මහ ජනතාවගේ පවා අවධානය විශාල වශයෙන් යොමු වූ කරුණක් බවට පත්වී තිබුණි. එහෙත් මේ පිළිබඳව රජය පාර්ශ්වයෙන් දැඩි අවධානයක් යොමු වූ බවක් දක්නට නැත. එසේ තිබියදී 2019.04.16 දින මඩකලපුවේ කාත්තන්කුඩි ප්‍රදේශයේ පුපුරණ ද්‍රව්‍ය සවිකරන ලද යතුරු පැදියක් අක්කර 43ක් පමණ විශාල හිස් ඉඩමක් තුළදී පුපුරුවා ගැනීමක් පිළිබඳව, පොලිසියට වාර්තා වන අතර මේ පිළිබඳව තොරතුරු සොයා බැලූ රාජ්‍ය බුද්ධි සේවාව විසින් මෙය කිසියම් කණ්ඩායමක් විසින් ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කර ඇති පිපිරීමක පෙරහුරුවක් විය හැකි බවට 2019.04.18 දින පොලිස්පතිවරයාට දන්වා ඒ ගැන ඔහුගේ අවධානය යොමු කර ඇත.

එසේම මෙම පිපිරවීම සහ මාවනැල්ල හා වනාතවිල්ලුව සිදුවීම් අතරෙහි සබඳතාවයක් පවත්නා බවත් එය මොහොමඩ් සහරාන්ගේ කණ්ඩායමේ ක්‍රියාවක් බවටත් රාජ්‍ය බුද්ධි සේවාව විසින් වැඩි දුරටත් පෙන්වා දී ඇත.

සියලු කරුණු එසේ සිදුවෙමින් පැවතියදී, නුදුරු දිනකදීම මොහොමඩ් සහරාන් ඇතුළු කණ්ඩායමක් විසින් කතෝලික පල්ලිවලට සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කිරීමේ සූදානමක් පවතින බවට බුද්ධි තොරතුරක් 2019.04.05 රාජ්‍ය බුද්ධි සේවාවට ලිඛිතව ලැබෙන අතර ඔහු එය විශ්ලේෂණය කිරීමෙන් පසු 2019.04.07 දින ජාතික බුද්ධි ප්‍රධානී වෙත යොමු කර ඇත. එම බුද්ධි

තොරතුර 2019.04.20 දින පස්වරුවේදී නැවත තහවුරු කරමින් ප්‍රහාරය එදින රාත්‍රී හෝ පසු දින එනම් 2019.04.21 දින සිදුවන බවට නිශ්චිතව දන්වා ඇත. සියල්ල එසේ සිදුවෙමින් පැවතියදී, ත්‍රස්තවාදීන් සැලසුම් කළ පරිදි ප්‍රහාරය 2019.04.21 දින පෙ:ව: 08.45ට ආරම්භ මධ්‍යහනය දක්වා සිදු කරන ලදී.

මෙම මණ්ඩලය ඉදිරියේ අනාවරණය වූ සාක්ෂි අනුව ශ්‍රී ලංකාව තුල ඉස්ලාම් අන්තවාදය ආරම්භවීම සහ එය ක්‍රමානුකූලව වර්ධනය වීමට අදාලව රාජ්‍ය බුද්ධි සේවාව විසින් 2015 වසරේ සිට වාර්තා 170 ක් පමණ ආරක්ෂක ලේකම්, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානී සහ අනෙකුත් අදාල නිලධාරීන් වෙත යොමුකර තිබී ඇත. එසේම මෙම තත්ත්වය වරින් වර පසුගිය වසර කිහිපය තුල ආරක්ෂක අමාත්‍යාංශයේ බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදීත් ආරක්ෂක මණ්ඩලයේදීත් සාකච්ඡාවට භාජනය වූ බව සාක්ෂිකරුවන්ගෙන් අනාවරණය විය. එසේම මෙරට මුස්ලිම් අන්තවාදය ව්‍යාප්තවීම සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂ මහතා 2016.11.18 වන දින අය වැය විවාදය අවස්ථාවේදී දීර්ඝ කරුණු දැක්වීමක්ද සිදුකර ඇති බව අනාවරණය විය. මෙකී වාතාවරණය යටතේ සහ විශේෂයෙන් 2018.12.23 වන දින මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිමවලට අලාභ හානි කිරීමේ සිද්ධියත් 2019.01.16 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පුත්තලමේ වනාතවිල්ලුව ප්‍රදේශයේදී මොහොමඩ් සහරාන් හෂීම්ගේ කණ්ඩායමට අයත්ව තිබූ රහසිගත ස්ථානයක තිබී බෝම්බ සෑදීමට උපයෝගී කරගත හැකි භාණ්ඩ සමඟ සංග්‍රාමික උපකරණ රැසක් සොයාගනු ලැබූ අවස්ථාවේදීත් එහි ඇති භයානක බව වටහාගෙන මෙම අන්තවාදී කණ්ඩායම මැඩ පැවැත්වීමට රජයේ පාර්ශ්වයෙන් දැඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුව තිබුණි. විශේෂයෙන් මොහොමඩ් සහරාන් හෂීම් නායකත්වය දෙනු ලබන බවට හඳුනාගෙන තිබූ ජාතික තවුහිද් ජමාත් සංවිධානය තහනම් කිරීමට පියවර ගත යුතුව තිබුණි. නමුත්, එවැන්නක් එම අවස්ථාවේදී සිදු නොකිරීම මොහොමඩ් සහරාන් හෂීම්ගේ කණ්ඩායමට 2019.04.21 වන දින ප්‍රහාරය එල්ල කිරීම දක්වා ඔවුන්ගේ සැලසුම් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම නිර්මාණය වීමට හේතුවී ඇති බව පෙනේ.

මෙවැනි වාතාවරණයක් යටතේ 2019.04.21 වන දින ත්‍රස්තවාදීන්ට සැලසුම් කළ පරිදි ඔවුන්ගේ ප්‍රහාරයන් කිසිඳු බාධාවකින් තොරව දියත් කිරීමට හැකි වූයේ ඒ වන විට ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් රජයේ සියළු පාර්ශවයන්ගේ අවධානය ඉතා පහළ මට්ටමක පැවැති නිසා බව පෙනී යයි. මෙය කිසිසේත් සිදු නොවිය යුත්තකි. කුමන තත්ත්වයක් යටතේ වුවද ජාතික ආරක්ෂාව සුළු කොට නොතැකිය යුතුය. සැම විට එයට අන් කිසිඳු කරුණකට නොදෙවෙනි අන්දමේ ප්‍රමුඛත්වයක් ලබාදී ඉදිරියේදීත් ක්‍රියා කිරීම රජයේ පරම වගකීම විය යුත්තේය.

23. ත්‍රස්තවාදයට සම්බන්ධ සංවිධාන සඳහා අනුබල දීම පිළිබඳව ඇතැම් මුස්ලිම් දේශපාලනඥයින්ට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් මණ්ඩලයේ නිර්දේශයන්:

ඇතැම් දේශපාලනඥයින් ඉස්ලාමීය අන්තවාදයට අනුබල දී ඇති බවට ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ මේ වන විට ජනතාව තුල මතවාදයක් ගොඩනැඟී ඇති බව මණ්ඩලය නිරීක්ෂණය කර ඇති අතර, 2019.05.06 වන දින මෙම මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දෙනු ලැබූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂ මහතාද මේ හා සමාන මතයක් දරමින් අමාත්‍ය රිෂාඩ් බදූර්දීන් මහතා, බස්නාහිර පළාත් ආණ්ඩුකාර අසාද් සාලි මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා සහ නැගෙනහිර පළාත් ආණ්ඩුකාර එම්.එල්.ඒ.එම්.හිස්බුල්ලා මහතා ඉස්ලාම් අන්තවාදයට සහාය දක්වන බවට සඳහන් කොට ඇත. මෙම කරුණු මත මේ වන විට සමාජය තුල ගොඩනැඟී ඇති සංවේදී තත්ත්වය පිළිබඳ සලකා බැලීමේදී එල්ලවී ඇති චෝදනාවන්හි සත්‍ය අසත්‍යතාවය පිළිබඳව නොපමාව පූර්ණ විමර්ශනයක් සිදුකල යුතු බවත්, මණ්ඩලයේ නිගමනයයි.

24. පූර්ණ බලැති ජනාධිපති කොමිෂන් සභාවක අවශ්‍යතාවය:

2019:04.21 වන දින එල්ල වූ ප්‍රහාරයෙන් පසු අන් කවරදාකටත් වඩා මුස්ලිම් සහ අනෙකුත් ජාතිකයන් අතරෙහි එතෙක් පැවැති අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය පළුදුවී ඇති බව මණ්ඩලයට නිරීක්ෂණය වේ. මෙම තත්ත්වය දිගින් දිගටම පැවතිය හොත් එමගින් ජාතීන් අතරෙහි සංහිඳියාවට විශාල හානියක් සිදුවනවා පමණක් නොව නීතිගරුක සහ මධ්‍යස්ථ මුස්ලිම් ප්‍රජාව දැඩි අපහසුතාවයනට පත්වීමද නොවැලැක්විය

හැකි කරුණක් වනු ඇති බව පෙනේ. එබැවින්, මෙම තත්ත්වය සමනය කිරීමට නම් 2019.04.21 වන දින එල්ල වූ ප්‍රහාරය හුදෙක් මොහොමඩ් සහරාන් හෂීම් ඇතුළු තවුහිද් ජමාත් සංවිධානය සහ ඔවුන්ගේ හිතවාදීන් විසින් පමණක් සිදුකළ ක්‍රියාවක්ද එසේ නොමැති නම්, මෙම ප්‍රහාරය පිටුපස වෙනත් අදෘශ්‍යමාන බලවේගයක් පැවැතියද යන්නත් කඩිනමින් අනාවරණය කරගැනීම අත්‍යවශ්‍යය.

එසේම ජාතීන් අතරෙහි දැනට පළුදුවී ඇති අන්‍යොන්‍ය විශ්වාසය සහ අවබෝධය නැවත ගොඩනැඟීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීමද අත්‍යවශ්‍ය කරුණකි. එබැවින් මෙකී අරමුණු ඉටු කරගැනීම සඳහා සියළු ජාතීන් නියෝජනය වන පරිදි පූර්ණ බලැති ජනාධිපති කොමිෂන් සභාවක් ඉතා ඉක්මණින් පත් කිරීම සුදුසු බවට මණ්ඩලය නිර්දේශය කරයි.